# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1937/7 – 2015 ඔක්තෝබර් 19 වැනි සඳුදා – 2015.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාකුඹුර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එම්එච්ආර්/2014/687 සහ 2014.10.24 දිනැති පුගමන අනුරේඛනයේ සඳහන් කැබලි අංක 1 සිට 4 දක්වා ප්‍රමාණයෙන් හෙක්. 0.8208 ක් පමණ වන පහත නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 1 – මහකුඹුර වෙල්යාය – ප්‍රමාණය: හෙක්. 0.4198**
උතුරට: රජ මාවතේ වරි. අංක 90/94 සහ 90/95 දරන ඉඩම් සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: කැබලි අංක 2, නිදහස් මාවතේ වරි. අංක 27/50 දරන ඉඩම සහ නිදහස් මාවතේ වරි. අංකය සොයාගත නොහැකි පී. ජී. ගාමිණී සහ තවත් අය හිමිකම් කියන ඉඩම්; බටහිරට: කැබලි අංක 2, නිදහස් මාවතේ වරි. අංක 27/50 දරන ඉඩම, නිදහස් මාවතේ වරි. අංකය සොයාගත නොහැකි පී. ජී. ගාමිණී සහ තවත් අය හිමිකම් කියන ඉඩම් සහ රජ මාවතේ වරි. අංක 90/94 සහ 90/95 දරන ඉඩම්.

02. **කැබලි අංක 2 – මහකුඹුර වෙල්යාය – ප්‍රමාණය: හෙක්. 0.3176**
උතුරට: කැබලි අංක 1 සහ ඇළ; නැගෙනහිරට: කැබලි අංක 1, ඇළ, කැබලි අංක 4 සහ 3; දකුණට: කැබලි අංක 4, 3 සහ නිදහස් මාවතේ වරි. අංක 27/50 දරන ඉඩම; බටහිරට: කැබලි අංක 3, නිදහස් මාවතේ වරි. අංක 27/50 දරන ඉඩම සහ කැබලි අංක 1.

03. **කැබලි අංක 3 – මහකුඹුර වෙල්යාය – ප්‍රමාණය: හෙක්. 0.0713**
උතුරට: කැබලි අංක 2; නැගෙනහිරට: කැබලි අංක 2 සහ 4; දකුණට: කැබලි අංක 4 සහ 2; බටහිරට: කැබලි අංක 2.

04. **කැබලි අංක 4 – ප්‍රමාණය: හෙක්. 0.0121**
උතුරට: කැබලි අංක 2, 3 සහ ඇළ; නැගෙනහිරට සහ දකුණට: ඇළ සහ කො. 9381 වැනි මූලික පිඹුරේ කැබලි අංක 1; බටහිරට: පාර, නිදහස් මාවතේ වරි. අංක 27/50 දරන ඉඩම, කැබලි අංක 2 සහ 3.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: 4-3/12/2014/යූඩීඒ/188.
2015 අගෝස්තු මස 10 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 24